ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

14.0 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති ගැසට් නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

15.0 මෙම විභාග නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම පළකරනු ලබන අතර එම භාෂා පදමාලා අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පදමාලාව බලාත්මක වන බව සැලකිය යුතුය. තව ද මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත.

සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2025 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

11 - 130/1

---

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

**1.0** **2017.06.21 දින හා අංක 2024/35 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි විධිවිධාන අනුව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහාවන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ Our Services යටතේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත (online) ක්‍රමයට පමණි. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 දෙසැම්බර් 08 දින වේ. මෙම විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් 2026 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ලැබේ.**

**සටහන 1** -මාර්ගගත අයදුම්පත් භාරගැනීම **2025 නොවැම්බර් මස 10 වන දින පෙ.ව. 9.00ට විවෘත වන අතර 2025 දෙසැම්බර් මස 08 වන දින ප.ව. 9.00ට** අවසන් වේ.

**සටහන 2** - දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

2.0 මෙම විභාග ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත. තව ද පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

3.0 වැටුප් පරිමාණය: අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව MN 3 -2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය

රු. 52,250 – 10x800 – 11x1,190 – 10x1,320 – 10x1,350 – රු. 100,040/- ක් වේ.

එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් එම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

4.0 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම විභාගයෙන් ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට පත්වන නිලධාරින්ට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට නිලධාරියා යටත් විය යුතු වේ.

5.0 මෙම තරග විභාගය මගින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාවෙන් 3%ක් ආබාධ සහිත පුද්ගලයන් සඳහා වෙන් කෙරෙනු ඇත. විභාගයේදී සුදුසුකම් ලබන **ආබාධිත අයදුම්කරුවන්** අතරින් ඉහළ ලකුණු මට්ටමේ 3%ක ප්‍රතිශතයක් පමණක් කුසලතා අනුපිළිවෙළ අනුව පත්වීම් ලබා දීම සඳහා තෝරා ගැනෙනු ඇත. මේ සඳහා සුදුසුකම් ලැබීමට විභාගයේ එක් එක් විෂයය

සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් බැගින්වත් (40%) අයදුම්කරුවකු විසින් ලබාගත යුතු වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 27/88හි විධිවිධාන, ආබාධිත පදනමින් බඳවා ගැනීම සඳහා අදාළ වේ.

**සටහන -** මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමේදී අදාළ පරිදි තමා ආබාධිත කොන්දේසි යටතේ අයදුම් කරන බව සඳහන් කළ යුතු අතර, <u>**ආබාධිත නොවන අයකු සාවද්‍ය ලෙස ආබාධිත යැයි සඳහන් නොකළ යුතුය.**</u>

6.0 **සේවා කොන්දේසි :-**

i. රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2024/35 සහ 2017.06.21 වැනි දින දරන අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලට ද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 වන දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

ii. විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වේ. නිලධාරින් III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03)ක් ගත වීමට පෙර සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වීම හා නිලධරයන්ගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා සෑහීමට පත්වන්නේ නම් වසර තුන අවසානයේ දී ඒ බව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කිරීමෙන් පසු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත්වන්නේ නම් අදාළ නිලධාරියාගේ පත්වීම ස්ථිර කරනු ලැබේ.

iii. පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

iv. ඔබ පත්වීම සඳහා සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

7.0 **සුදුසුකම් :** ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය.

(ඒ අනුව 2007.12.08 දිනට හෝ ඊට පෙර හා 1995.12.08 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත)

(ඈ) අධ්‍යාපන සුදුසුකම් :

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එකවර සමත්ව තිබීම

(ඉ) වෘත්තීය සුදුසුකම් **:**

(i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම;

හෝ

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම;

*හෝ*

(iii) පුස්තකාල විද්‍යාව පිළිබඳ ඉහත (i) හෝ (ii) සුදුසුකම්වලට වඩා ඉහළ සුදුසුකමක් ලබා තිබීම (එවැනි සුදුසුකම් අදාළ විශ්වවිද්‍යාලවල බලධාරීන් හා ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ද විමසමින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.)

**සටහන :**

(i) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් **අයදුම්පත් කැඳවන අවසාන දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.**

(ii) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

8.0 **විභාග කොන්දේසි :**

(i) මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් සම්පූර්ණ කළ යුතුය. සම්පූර්ණ කරන ලද තොරතුරුවල නිරවද්‍යතාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව යොමු කිරීම (submit) කළ යුතුය. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (ඊ-මේල්) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.

(ii) විභාග ගාස්තුව රු. 600.00කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transaction)

iii. ලංකා බැංකු ඔන්ලයින් බැන්කින් ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon)

iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

**සටහන:**

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදලම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

(i) මෙහි දැක්වෙන සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් මාර්ගගතව පමණක් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින්/වෙබ් නිවේදනයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අයදුම්කරුවකු වේ

නම් වෙබ් නිවේදනයේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, යොමු අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(iv) ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදුකර ගත යුතුය. විභාග ශාලාවේ දී හෝ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම සලකා බලනු නොලැබේ.

(v) විභාගය සඳහාවන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

**9.0 විභාගයට පෙනී සිටීම :**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවකු ඔහුගේ/ ඇයගේ ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය. සෑම අයදුම්කරුවකුම අදාළ ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම විභාගයට පෙනී සිටින දින, විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු රීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ පළකර ඇත.

*සටහන :* අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට හෝ මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

**10.0 අපේක්ෂකයාගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කිරීම සඳහා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළුවිය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**11.0 සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු/ ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින්ම යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

**12.0 විභාග පටිපාටිය :**

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් මෙම විභාගය

පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *විෂයය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| (01) පුස්තකාල විද්‍යාව | පැය 03 | 100 | 40% |
| (02) බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| (03) සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |

ඉහත විෂයයන්ට අදාළ විෂයය නිර්දේශය පහත පරිදි වේ:

12.1 (1) පුස්තකාල විද්‍යාව :

(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය

පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය, පුරාතන සහ නූතන ලෝකයේ ප්‍රධාන පුස්තකාල
ලේඛන කලාවේ සහ පොත් ඇතුළු ලේඛන මාධ්‍යයන්හි ආරම්භය හා විකාශනය
මුද්‍රණ ශිල්පයේ ආරම්භය, ව්‍යාප්තිය සහ පුස්තකාල හා සමාජ සංවර්ධන විෂයය කෙරෙහි බලපෑම

*පුස්තකාල වර්ග*

විශේෂ පුස්තකාල

**රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා ආදී ආයතන ආශ්‍රිත පුස්තකාල, පර්යේෂණ පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්**

ශාස්ත්‍රීය පුස්තකාල

**විශ්වවිද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන ආශ්‍රිත පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්**

පාසල් පුස්තකාලය

**මහජන පුස්තකාලය**

**පිරිවෙන් පුස්තකාල හා ආරාමික/ ආගමික ආයතන පුස්තකාල**

පුස්තකාල කමිටු - ව්‍යුහය, අවශ්‍යතා, වැදගත්කම හා කාර්යභාරය
පුස්තකාල වෘත්තියට අදාළ විද්වත් වෘත්තීය සංවිධාන හා ඒවායේ කාර්යභාරය : ජාතික හා ජාත්‍යන්තර (ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමරිකාව, බ්‍රිතාන්‍යය)
පුස්තකාල ගොඩනැගිලි - සැලසුම්කරණය, සලකා බැලිය යුතු කරුණු
පවත්නා ගොඩනැගිල්ලක පුස්තකාලයක් ස්ථාපනය, සංවිධානය හෝ වැඩි දියුණු කිරීම
පුස්තකාල ද්‍රව්‍ය නඩත්තුව, සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)
ආපදා (Disasters) සහ ආපදා කළමනාකරණය (Disaster Management)

*(2) දැනුම සහ තොරතුරු සංවිධානය :*

ග්‍රන්ථ වර්ගීකරණයේ අරමුණු සහ ප්‍රයෝජන

ශ්‍රී ලංකාවේ පුස්තකාලයන්හි භාවිත වන ප්‍රධාන වර්ගීකරණ ක්‍රම : ඩිවි දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය

පුස්තකාල සූචියේ අරමුණු, ඇංග්ලෝ ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහය (AACR) සම්ප්‍රදාය
ග්‍රන්ථ විස්තරය
AACR 2 සංස්කරණ භාවිත කරමින් සංඛ්‍යා ලේඛන සම්පාදනය

*(3) පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා :*

විවිධ පුස්තකාල සම්පත්

එකතු සංවර්ධනය, එකතු සංවර්ධන ප්‍රතිපත්ති හා එහි වැදගත්කම

පුස්තකාල සම්පත් තේරීම ඇතුළු ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය

(i) පුස්තකාල සම්පත් තේරීමේ මූලධර්ම, මූලාශ්‍ර
(ii) ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය,පිරිසැකසුම්කරණය ඇතුළු විවිධ තාක්ෂණික සේවා
(iii) තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය

ප්‍රකාශනය, ප්‍රකාශන හිමිකම් හා වාරණය

ප්‍රවර්තන සම්ප්‍රජානන සේවය (Current Awareness Service)

පාඨක අධ්‍යාපන වැඩසටහන්

මහජන සම්බන්ධතා සහ පුස්තකාල ප්‍රචාරණය

*(4) තොරතුරු සන්නිවේදන තාක්ෂණය*

පුස්තකාලවල පරිගණක භාවිතය හා පුස්තකාල සේවාවන් හා කාර්යයන්වල දී තොරතුරු තාක්ෂණයේ වැදගත්කම හා ඵලදායිතාව

- ඉහත ක්ෂේත්‍ර 4 ආවරණය වන සේ සකස් කෙරෙන ව්‍යුහගත රචනා ශෛලියේ ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 03 යි.

*12.2 (02) බුද්ධි පරීක්ෂණය :*

පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුවන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතාව වටහා ගැනීමෙහි ලා අයදුම්කරුවකු සතු හැකියාව මැන බැලීම.

- බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.
  කාලය පැය 01 යි.

12.3 (03) සාමාන්‍ය දැනීම

ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද පුස්තකාල විෂයය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අයදුම්කරුගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

- බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. කාලය පැය 01 යි

*සටහන :*

පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතළිහක් බැගින්වත් (40%) අයදුම්කරුවකු විසින් ලබාගත යුතුවන අතර, විවෘත තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

13.0 **විභාග ප්‍රතිඵල :**

මෙම නිවේදනයේ 12.0 හි සටහන අනුව එක් එක් විෂයයෙන් ලකුණු 40%ට නොඅඩුව ලබාගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලද පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළකිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

14.0 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

15.0 මෙම විභාග නිවේදනය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම පළකරනු ලබන අතර එම භාෂා පදමාලා අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පදමාලාව බලාත්මක වන බව සැලකිය යුතුය.

තව ද මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට්* පත්‍රයේ මුල සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

**එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2025 නොවැම්බර් මස 03 දින,
කොළඹ 07,
නිදහස් චතුරශ්‍රය,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ දී ය.

11 - 130/2

## MINISTRY OF PUBLIC ADMINISTRATION, PROVINCIAL COUNCILS AND LOCAL GOVERNMENT

### Open Competitive Examination for Recruitment to Grade III of Sri Lanka Government Librarians' Service – 2025

1.0 APPLICATIONS are called for the Open Competitive Examination for Recruitment to Grade III of the Sri Lanka Government Librarians' Service according to the provisions of the Sri Lanka Government Librarians' Service Minute published in *Gazette Extraordinary* No. 2024/35 of the Democratic Socialist Republic of Sri Lanka, dated 21.06.2017. The relevant application is published on the website of the Department of Examinations of Sri Lanka, www.doenets.lk, under "Our Services", and the applications can only be submitted online. The closing date for applications is 08th of December 2025. This examination will be held by the Commissioner General of Examinations in the month of February 2026 in Colombo.

*Note 1* - Receipt of online applications will be open from 10th of November 2025 at 9:00 a.m. and will close on 08th of December 2025 at 9.00 p.m.

*Note 2* – Officers who are serving in public/ provincial public service at present should submit a copy of the application to the Head of the Institution for inclusion in the personal file. They must present a copy of the application certified by the Head of the Institution when they are called for the interview.

2.0 The applicants who have satisfied qualifications based on the merit on the results of this examination will be selected for appointment to the posts in Grade III of the Sri Lanka Government Librarians' Service. The Director General of Combined Services reserves the right to postpone or cancel the examination. The number and the effective date of appointments shall be determined by the Director General of Combined Services. Further, the appointing authority reserves the right to refrain from filling any or all of the vacancies.

3.0 *Salary scale* :- According to Schedule II of Public Administration Circular No.: 10/2025 dated 25.03.2025, salary code applicable to this post is MN -3-2025 and the salary scale applicable is Rs. 52,250 – 10x800 – 11x1,190 – 10x1,320 – 10x1,350 – 100,040/- . You shall be entitled to this salary with effect from 01.01.2027. Until such time, you will be paid salary as per the provisions of Schedule III of this circular.

4.0 This post is permanent and pensionable. The officers, who are selected from this examination to be recruited to Grade III of the Sri Lanka Government Librarians' Service, must be subjected to any policy decisions taken by the Government in the future, with regard to the pension scheme to which they are entitled.

5.0 Three percent (3%) from the vacancies to be filled shall be reserved for persons with disabilities. Only 3% of the persons with disabilities who secure highest marks in the examination out of those who get qualified at the examination shall be selected for appointments on the order of merit. An applicant must secure at least forty percent (40%) of the marks for each subject of the examination to be eligible for this. The provisions of Public Administration Circular No. 27/88 shall be applicable for recruitment of persons with disabilities.

*Note:* The applicant should mention in the application that he/she applies under disabled conditions and **a person who is not disabled should not imply himself/ herself as a disabled person**.

6.0 Service conditions:

(i.) Selected candidates will be appointed to Grade III of the Sri Lanka Government Librarians' Service subject to the general conditions that govern appointments in the public service, the terms and conditions set out in the Minute of the Sri Lanka Government Librarians' Service published in *Gazette Extraordinary* No. 2024/35 of the Democratic Socialist Republic of Sri Lanka, dated 21.06.2017, any revisions already made or to be made hereinafter to the said Service Minute, Financial Regulations, the provisions of the Establishments Code and the Procedural Rules of the Public Service Commission published in *Gazette Extraordinary* No. 2310/29 dated 14.12.2022.

(ii.) An officer appointed to the Grade III of the Sri Lanka Government Librarians' Service on the results of the Open Competitive Examination shall be subjected to a probation period of three (03) years. The appointment of the officer shall be confirmed if the officer passes the first Efficiency Bar Examination within three (03) years from the date of recruitment to Grade III as stipulated in the Service Minute being recruited if the Head of the Department is satisfied that the officer's work, attendance and conduct are satisfactory and Director General of Combined Services is satisfied after it is informed to him at the end of three years.

(iii.) The officer must compulsorily serve at the workplace to which he/she is appointed first for three years. However, the Appointing Authority reserves the right to transfer any officer before the lapse of the said period, on special reasons as determined by him, if it is required to make such a transfer.

(iv.) The officer is required to obtain proficiency in the prescribed official language based on the language medium in which he/she has satisfied the qualifications, as per the provisions of Public Administration circular No. 18/2020 dated 16.10.2020 and consequent circulars.

7.0 *Qualifications* :- Applicants are required to possess following qualifications for recruitment to posts in Grade III of Sri Lanka Government Librarians' Service.

(a) Shall be a citizen of Sri Lanka;
(b) Applicants shall be of excellent character;
(c) Shall be not less than 18 years and not more than 30 years of age as at the closing date of applications.

(**Accordingly applicants whose date of birth falls on or before 08.12.2007 and on or after 08.12.1995 are strictly eligible to apply for the examination**)]

**(d) Educational Qualifications:**

I. Shall have passed the G.C.E. (O/L) examination at **one sitting** with six (06) subjects including credit passes for Sinhala/ Tamil/English, Mathematics and two other subjects;

and

II. Shall have passed the G.C.E (A/L) examination at **one sitting** with all subjects (Except General Test and General English)

**(e) Professional Qualifications:**

(i) Shall have completed the three year diploma in Library Science from a university recognized by the University Grants Commission;

*Or*

(ii) Shall have completed the three year diploma in Library Science offered by Sri Lanka Library Association;

*Or*

(iii) Shall have acquired a higher qualifications in Library Science than the (i) and (ii) above. (Such qualifications shall be determined by the Director General of Combined Services communicating with the authorities of the relevant universities and Sri Lanka Library Association)

**Note:** (i) It is compulsory that all the applicants should satisfy all the qualifications relevant to the post on or before the closing date of the application.

(ii) Every applicant shall be physically and mentally fit in every aspect to perform the duties of the post and to serve in any part of Sri Lanka.

8.0 **Conditions of the Examination**

(i) Online Examination Application should strictly be filled in English and submitted after confirming the accuracy of the particulars. Before completing the online application, you should download the common instructions sheet, and the instruction therein should be strictly followed. Incomplete applications shall be rejected without any notice. Once the Department of Examinations receives the soft copy of the application submitted by the applicant online, it will be verified and the candidates will be notified via SMS to the mobile phone number used to access the system or via email whether the application was accepted/ not accepted by the Department as a valid application.

(ii) Examination fee is Rs. 600/-. Payments should be made only via the following methods of payment provided by the online system.

i. Any Bank Credit Cards
ii. Any Bank Debit Cards with online payments facilities
iii. Online Banking Method of Bank of Ceylon
iv. Any Branch of the Bank of Ceylon

**Note**

**(a)** Instructions on making payment through the above methods are published under technical instructions relevant to the examination on the website.

**(b)** Receipt of payment will be notified via an SMS or email. The total of the examination fees should be paid and the applications with payment of lesser or higher amounts shall be rejected. The Department of Examination shall not be responsible for any error occurs during the payment of examination fees via the above methods of payments.

**(c)** Under no circumstances the examination fee will be refunded or transferred to pay any other examination fee.

(iii) Commissioner General of Examinations will issue admissions only online to applicants, who have paid the prescribed examination fee and submitted the perfected application online accurately on or before the closing date for applications, on the assumption that only those who have satisfied the qualifications mentioned in the *Gazette* have applied. Applicants will be notified via an SMS or web notice as soon as the admission cards are issued to them. If the admission card is not received, steps should be taken to notify the Institutional Examination Organization Branch, Department of Examinations, in the manner specified in the advertisement. When such an inquiry is made, it will be more effective to send a letter of request mentioning accurately the name of the examination, the full name of the applicant, the National Identity Card number, the reference number and the address to the email address mentioned in the web notice. Further, it would be advisable to keep the copy of the application kept in your possession and the copy of the receipt relevant to payment of examination fee to prove any information requested by the Department of Examinations.

(iv) If any revisions are required after checking the admission card, the Department of Examinations of Sri Lanka should be contacted early and the relevant revisions should be made as per the application. Requests made at the examination hall to make revisions will not be considered.

(v) Applicant's signature in the admission card should have been attested by a Principal of a Government School, Justice of the Peace, Commissioner for Oaths, Notary Public, an Officer in Staff Grade holding a permanent post in the Public or Provincial Public Service or a chief incumbent of a Buddhist temple or a Nayaka Thero or a chief prelate of any other religious place or a prelate holding a considerable level of religious order.

9.0 **Appearing for the examination**

(a) Every applicant should furnish the admission card to the supervisor of the examination. Applicants who do not furnish the admission card shall not be allowed to sit the examination.

(b) Applicants should appear for the examination at the examination hall prescribed for him/her. Every applicant should furnish the admission card in which his/ her signature has been attested to the supervisor of the examination on the first day on which he/ she sit for the examination. A set of rules to be followed by every applicant is published in this *Gazette*.

*Note:* The issuance of an admission card to an applicant does not necessarily mean that he or she has satisfied the qualifications required for this post.

10.0 **Identity of the candidate:**

A candidate will be required to prove his/her identity at the examination hall to the satisfaction of the supervisor for each subject he offers. For this purpose, any of the following documents shall be accepted.

i. National Identity Card
ii. A valid passport
iii. Valid driving license in Sri Lanka

Candidates should enter the examination hall without covering their faces, enabling the verification of their identity and without covering ears enabling the verification of the fact that they are not wearing electronic devices used for communication. Those who refuse to verify their identity as such shall not be permitted to enter the examination hall. Further, candidates should keep their faces and ears uncovered until they leave the examination hall.

11.0 **Penalty for Furnishing False Information :-**

If it is found that any applicant is not eligible according to the rules and regulations of this examination, his/ her candidature can be cancelled at any time before, during or after the examination. If it reveals that a candidate has submitted false information knowingly or concealed any important matter he/she will be dismissed from the public service.

12.0 **Scheme of Examination :-**

(i) This examination will consist of three question papers. The examination will be held in Sinhala, Tamil and English media and the applicants will not be allowed to change the medium of examination selected by them.

| *Subjects* | *Duration* | *Marks* | *Pass mark* |
|---|---|---|---|
| 1. Library Science | 03 hours | 100 | 40% |
| 2. Intelligence Test | 01 hour | 100 | 40% |
| 3. General Knowledge | 01 hour | 100 | 40% |

The syllabus prescribed for the above subjects is as follows;

**12.1 (01) <u>Library science</u>**

**(1) Libraries and Librarianship**

Libraries and history of libraries, main libraries of the modern and ancient world

Origin and evolution of the art of writing and other written media including books

Origin of printing technology, expansion and the influence of the printing technology on libraries and the subject of social development

Types of libraries

Special libraries
Structure, functions and services of libraries in the institutions such as Government Ministries, Departments and Co-operations and research libraries.
Academic libraries
Structure, functions and services of libraries in universities and other higher educational institutions.
School libraries
Public libraries
Libraries in pirivenas, temples and libraries in other religious institutions

Library committees -Structure, necessity, significance and role

Organizations of professionals in relation to field of library science and functions of such organizations - National & international levels (Sri Lanka, India, America, Britain)

Buildings of libraries - Planning and other aspects to be considered

- Establishments of a library in an existing building, organization or improvement

Maintenance, conservation and preservation of library equipment

Disasters and disaster management

**(2) Organization of Information and Knowledge**

Objectives and benefits of book classification

Main classification methods applied in the libraries in Sri Lanka: Dewey decimal classification, universal decimal classification

Objectives of cataloguing, Anglo-American Cataloging Rules (AACR)

Bibliographical description

Compilation of entries using AACR-2

**(3) Library Resources and Information Services**

Various library resources

Improving collections, policies for improving collections and importance of the same

Acquisition, process including selection of library resources:

i. Principals and sources of the selection of library resources;
ii. Technological services including acquisition process, processing;
iii. Stock taking and weeding process.

Publishing, copyright and censorship

Current awareness service

Educational programmes for readers

Public relations and publicity for libraries

**(4) Information Communication Technology**

Application of computer technology in libraries, significance and productivity of information technology in library activities and functions.

A question paper consisting of structured essay type questions covering above 4 fields. All the questions are compulsory. Duration is 03 hours.

**12.2 (02) Intelligence Test**

This paper will be designed to assess the applicant's capacity for comprehension, quantification and perception of time-space relations by measuring applicant's inference and responses to problems presented in verbal, numerical and spatial contexts.

- A question paper consisting of 50 multiple choice questions and questions for short answers. All the questions are compulsory. Duration is 01 hour.

**12.3 (03) General Knowledge**

This paper will be designed to assess the applicants awareness and understanding of social, cultural, educational, political, economic and any other relating factors operating at national, regional and global environment or organizations as well as our society and also to assess general knowledge of applicants in Library Science and library field.

- A question paper consisting of 50 multiple choice questions and questions for short answers. All the questions are compulsory. Duration is 01 hour.

*Note:*
Applicants should score a minimum of 40% marks for each paper to become qualified for an appointment. Appointments will be made strictly following the order of marks scored so as to fill the number of vacancies reserved for the open competitive examination.

13.0 **Results of the examination**

The results sheet prepared on the order of the aggregate of marks secured by the candidates who have secured marks not less than 40% for each subject, as per Note 12.0 of this notification shall be submitted to the Director General of Combined Services, Ministry of Public Administration, Provincial Councils and Local Government. Upon the receipt of the approval of the Director General of Combined Services, the results of all the applicants who have sat for the examination shall be informed personally or published on the website, www.results.exams.gov.lk, by the Department of Examinations, Sri Lanka.

14.0 Applicants shall be bound by the rules and regulations imposed by the Commissioner General of Examinations for the purpose of conducting examinations and issuing results. They are liable to be subjected to any punishment imposed by the Commissioner General of Examinations for violation of these rules and regulations.

15.0 This examination notification will be published in Sinhala, Tamil and English languages and in case of any inconsistency among texts, the Sinhala text shall prevail. Any matter not referred to herein shall be determined by the Director General of Combined Services. All the applicants shall be bound to act in accordance with the common rules and regulations indicated in this *Gazette notification*.

N. U. Nishan Mendis,
Director General of Combined Services.

Ministry of Public Administration, Provincial Council and Local Government,
Independence Square,
Colombo 07.
03rd of November, 2025.

11-130/2

**12.** **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම -**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................................... යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු / ඇය මා ඉදිරිපිට දී ................................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද සහතික කරමි.

දිනය....................................

........................................,
අත්සන සහතික කරන ලද නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

***සටහන :***

දැනටමත් රජයේ තනතුරක් දරන අයදුම්කරුවෙකු විභාගයට ඉල්ලුම් කරන විට තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු ලවාද,එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු,කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙකු ,සාමදාන විනිශ්වයකාරවරයෙකු,දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු,ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතු යි.

**13.** දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන් සඳහා ( අනවශ්‍ය වචන කපා හරින්න)

ඉහත විස්තර දැක්වෙන අයදුම්කරුට/අයදුම්කාරියට මෙම විභාගය සඳහා පෙනී සිටීමට *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති/නැති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් සහතික කරමි.

.................................
දිනය

.......................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම:
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08 - 14

---

**රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

අංක 2462 දරන 2025 නොවැම්බර් මස 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද "ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025" විභාග නිවේදනයේ, **7.0 සුදුසුකම් ඡේදයේ (ඇ) කොටස** පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

7.0 සුදුසුකම් :

(*ඇ*) 2025.12.08 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2007.12.08 දිනට හෝ ඊට පෙර හා 1990.12.08 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

02. ඉහත සංශෝධනය මෙම විභාග අවස්ථාවට පමණක් අදාළ වන බව සැලකිය යුතු ය. එසේම අයදුම්කරුවන් තනතුරට අදාළ සියලු සුදුසුකම් 2025.12.08 දින වන විට සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් කර ගැනීමේ අවසාන දිනය 2026.08.28 තෙක් දීර්ඝ කරනු ලැබේ. මේ වනවිටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන්ට මෙම සංශෝධනය හේතුවෙන් නැවත අයදුම්පත් යොමු නොකරන ලෙස දැනුම් දෙනු ලැබේ.

**එන්. යූ. නිශාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2026 ජූලි මස 22 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08 - 19

---

**අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ III ශ්‍රේණියේ උපවැඩ පරීක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026**

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ III ශ්‍රේණියේ උපවැඩ පරීක්ෂක තනතුරෙහි පවතින පුරප්පාඩු පහක් (05) සඳහා බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් නොවැම්බර් මස කොළඹදී පමණක් පවත්වනු ලැබේ.

1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

(i.) විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් වන අතර, එහිදී සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

(ii.) ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාග විෂයයන් සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු හා කාලය පහත දැක්වේ.

| *අනු. අංකය* | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | තාක්ෂණික දැනුම | පැය 03 | 100 | 40% |

**බුද්ධි පරීක්ෂණය** : මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.

**තාක්ෂණික දැනුම** : ගොඩනැගිලි ඉදිකිරීම් මූලධර්ම, ඉදිකිරීම කාර්ය සඳහා පිඹුරුපත් සැකසීමේ හැකියාව වටහා ගැනීම, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙළ පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.
II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුන(03)ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර තුන(03) ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.
III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2020 ප්‍රකාරව රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග හා අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. **වැටුප් පරිමාණය :**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MT 1 - 2025 වැටුප් කේත අංකය යටතේ රු. 50,090-10x540-11x630-10x1,010-10x1,190- රු. 84,420/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි